879

# පැරණි ශ්‍රී ලංකාවේ ධජ පිළිබඳ විමර්ශනයක්

(ආරම්භයේ සිට ක්‍රි.ව.1815 දක්වා)

**එච්.ඒ.තුෂානි අප්සරා**

**FGS/HIST/MC/2009/002**

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ

ඉතිහාසය පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය

සඳහා ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 879 |
| වර්ග අංකය: | |

**2013**

## නිබන්ධ සාරාංශය

මෙම පර්යේෂණයේ අභිප්‍රාය වන්නේ පුරාතන අවධියේ සිට 1815 දක්වා භාවිත වූ කොඩිවල ප්‍රභවය සහ විකාශය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. මෙහිදී විවිධ කාල වකවානුවල කොඩි භාවිත වූ ආකාරය සහ අවස්ථා පිළිබඳව ප්‍රාථමික මූලාශ්‍රයා ගත තොරතුරු පාදක කර ගනිමින් සහ ද්විතියික මූලාශ්‍රයවල අන්තර්ගත තොරතුරු ද සැලකිල්ලට ගනිමින් වඩාත් ගැඹුරින් අදාළ කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ. විශේෂයෙන්ම පැරණි පළාත් කොඩි වූ හතර කෝරළේ ඉර හඳ කොඩිය, ඌව හංස කොඩිය, මාතලේ සුදු පට කොඩිය, සබරගමුවේ කහ පට කොඩිය, තුන් කෝරළේ භේරුණ්ඩ කොඩිය, වලපනේ මයුර කොඩිය, උඩ පළාතේ නෙළුම් මල් කොඩිය, නුවර කලාවියේ ගජසිංහ කොඩිය, තමන්කඩුවේ වලස් කොඩිය, උඩු නුවර කිඳුරු කොඩිය, හත් කෝරළයේ සිංහ කොඩිය, මාතර රුහුණු ගැටයා සහිත ඉරහඳ කොඩිය, බින්තැන්නේ ගිරවා කොඩිය ආදී කොඩි පිළිබඳවත්, රදළවරුන්ට අයත් වූ මහ කප්පින වලව්වේ නන්එදිරි කොඩිය, කැප්පෙටිපොල වලව්වේ ඌවේ හංසයා කොඩිය, ඉරහඳ කොඩිය, මාතර ඉලංගකෝන් වලව්වේ කොඩිය, කොස්මෝ විජයසේකර මුදලිඳුගේ රාවණා කොඩිය ආදී කොඩි පිළිබඳවත්, කුලවලට විශේෂ වූ සලාගම පෙහෙකරුවන්ගේ කොඩිය, නවන්දන්න නිර්මාණ ශිල්පීන්ගේ හනුමන්තා කොඩිය සහ කෞරව වංශික කොඩි වන මකර කොඩිය, ඉර හඳ කොඩිය, කෞරව රං කොඩිය, රෝමානු කතෝලික කොඩිය,ගරුඬ කොඩිය ආදී කොඩි පිළිබඳවත්, දේවාලවලට විශේෂ වූ සැවුල් කොඩිය, නුවර කතරගම දේවාලයේ පැරණි කොඩිය, ගුරුළු කොඩිය, අලුත් නුවර දැඩිමුණ්ඩ දේවාලයේ ඉර හඳ කොඩිය සහ සමන් දේවාලයේ කොඩිය ආදී කොඩි පිළිබඳවත් අවධානය යොමු කෙරේ.

මෙම පර්යේෂණයේදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස උපයෝගි කර ගනු ලබන්නේ ඓතිහාසික මූලාශ්‍රය පරිශීලන ක්‍රමවේදයයි. ඒ අනුව මහාවංසය, මහාභාරතඛ්‍යානය, සහස්සවත්ථුප්පකරණය, පැරකුම්බා සිරිත, මන්දාරම් පුර පුවත, සැළලිහිණි සන්දේශය, සපරගමුවේ පැරණි ලියවිලි, සපරගමු දර්ශන, An Historical Relation of Ceylon, Report on The Kegalla District of The Province of Sabaragamuwa වැනි මූලාශ්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

මුඛ්‍ය පද : ධජ, අලංකරණය, ජයග්‍රහණය, නිර්භීතභාවය, සටන්කාමීත්වය, තේජස, බලය, කීර්තිය, අනන්‍යතාව, පූජනීයත්වය